# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදා හැරීමේ ප්‍රමුඛතම ආයතනය ද වේ.

අප ආයතනය පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. කළමනාකරු (පර්යේෂණ හා නව ව්‍යාපෘති) (MM 1.1) II ශ්‍රේණිය

**සුදුසුකම්**

(අ) i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය හෝ අලෙවිකරණය / වාණිජ්‍යය / ව්‍යාපාර පරිපාලනය/ ආර්ථික විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම.

**හෝ**

ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබාගත් වෙනත් ඒ හා සමාන උපාධියක් ලබා තිබීම.

**සහ**

(ආ) පරිගණක සාක්ෂරතාවය

**සහ**

(ඇ) රජයේ / සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක / හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සැලසුම්කරණය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සේවා පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : රු. 66,470/-, 1,720/- X 10, 2,390/- X 15 = 119,520/-
(දළ මාසික වේතනය රු. 171,879/- ක් පමණ වනු ඇත)
(ඒ සඳහා මූලික වැටුප, ඖෂධ ආරක්ෂණ දීමනාව, කාර්යසාධන දීමනාව, ප්‍රවාහන දීමනා හා විශේෂ දීමනාව ඇතුළත් වනු ඇත.)

**වයස් සීමාව** : වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 2. කළමනාකරු (තත්ව ආරක්ෂණ රසායනාගාර) (MM 1.1) II ශ්‍රේණිය

**සුදුසුකම්**

(අ) i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව විෂයය ඇතුළත් විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම.

**හෝ**

ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබාගත් වෙනත් ඒ හා සමාන උපාධියක් ලබා තිබීම.

**සහ**

(ආ) විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ පසුබිමක් ලබා තිබීම වඩාත් සුදුසු වේ.

**සහ**

(ඇ) පරිගණක සාක්ෂරතාවය

**සහ**

(ඈ) රජයේ / සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක / හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, විශ්ලේෂණ රසායන විද්‍යාව / තාක්ෂණ ඇගයීම්/ ඖෂධ පිළිබඳ තත්ව ආරක්ෂණය යන ක්ෂේත්‍ර වලට අදාළව අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සේවා පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : රු. 66,470/-, 1,720/- X 10, 2,390/- X 15 = 119,520/-
(දළ මාසික වේතනය රු. 171,879/- ක් පමණ වනු ඇත)
(ඒ සඳහා මූලික වැටුප, ඖෂධ ආරක්ෂණ දීමනාව, කාර්ය සාධන දීමනාව, ප්‍රවාහන දීමනා හා විශේෂ දීමනාව ඇතුළත් වනු ඇත.)

**වයස් සීමාව** : වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 3. නීති නිලධාරී MM 1.1 - II ශ්‍රේණිය

**සුදුසුකම්**

(අ) ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු (Attorney-at-Law) ලෙස දිවුරුම් දී තිබිය යුතුය.

**සහ**

(ආ) නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක් රජයේ ආයතනයක/ සංස්ථාවක/ මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක/අධිකරණයේ නීතිඥ වෘත්තියේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ක්‍රියාකාරී නීති පරිචයක් හෝ වෘත්තීය නීති පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**වැටුප් පරිමාණය** : රු. 66,470/-, 1,720/- X 10, 2,390/- X 15 = 119,520/-
(දළ මාසික වේතනය රු. 171,879/- ක් පමණ වනු ඇත)
(ඒ සඳහා මූලික වැටුප, ඖෂධ ආරක්ෂණ දීමනාව, කාර්ය සාධන දීමනාව, ප්‍රවාහන දීමනා හා විශේෂ දීමනාව ඇතුළත් වනු ඇත.)

**වයස් සීමාව** : වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**අයදුම්කරුවන්,**

i. ශ්‍රී ලාංකිය පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරේ රාජකාරි නිසියාකාරව කිරීමට අවශ්‍ය කායික හා මානසික ශක්තිය තිබිය යුතුය.
iii. සුපිළිපන් චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

තෝරාගත් අයදුම්කරුවන් හට ඉහත මාසික දීමනාවන්වලට අමතරව පහත සඳහන් ආකර්ෂණීය අනෙකුත් ප්‍රතිලාභ හිමිවනු ඇත.

- මාසික පැමිණීමේ දිරි දීමනාව
- ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූරණය
- වාර්ෂික ප්‍රසාද දීමනා
- වෛද්‍ය ප්‍රතිලාභ හා සේවකයාට හා පවුලේ අය සඳහා රෝහල්ගත වීමේ වෛද්‍ය රක්ෂණාවරණය
- දිවා ආහාර දීමනාව

**බඳවා ගැනීමේ ක්‍රියාවලිය**

1. අයදුම්පත් සමග සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් ඉදිරිපත් කළ යුතු අතර, වයස, අධ්‍යාපන සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, වර්තමාන තනතුර, වැටුප් පියවර හා වැටුප් පරිමාණය මීට පෙර දැරූ තනතුරු, පෙර සේවා යෝජකයන් වෙත සේවයට එක් වූ හා සේවයෙන් ඉවත් වූ දිනයන් ඇතුළත් විය යුතුය. එසේම ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, අදාළ සහතිකපත්වල පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකවරුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද ඉදිරිපත් කළ යුතුය. අදාළ සහතිකපත්වල පිටපත් නොමැතිව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.
2. රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආදළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.
3. පොදු කොන්දේසි
   - අයදුම්කරුවන් විසින් තනතුරක් සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ලැබූ අයෙකු ලෙස සලකනු ලබන්නේ, අවශ්‍ය සියලූ සුදුසුකම් 2026.10.26 දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබේ නම් පමණී.
   - අයදුම්කරුවන් සතුටුදායක සේවා කාලයකින් හෙබි විය යුතුය.
   - අයදුම්පතෙහි සපයා ඇති සියලූ තොරතුරු නිවැරදි හා සම්පූර්ණ බව අයදුම්කරුවන් විසින් තහවුරු කළ යුතුය.
   - ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
   - ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව අයදුම්කරුවන් සංස්ථාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.
   - මෙම දැන්වීමෙන් ආවරණය නොවන ඕනෑම කරුණක් හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය අතරතුර පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර එම තීරණය අවසන් තීරණය වනු ඇත.

අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය, ලියාපදිංචි තැපෑලෙන් 2026.10.26 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) වැ.බ.**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,**
**"මෙහෙවර පියෙස", 16 වන මහල, නො. 41,**
**කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05. දුරකථන අංකය 0112 320 356 -9**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED